# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2361/02 – 2023 දෙසැම්බර් මස 04 වැනි සඳුදා – 2023.12.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2019/263

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්. ජී. ඩී. මීවතුර මයා, ඩබ්. එම්. සුනිල් ජයරත්න මයා බාරේ, C/298/2, සේනානායකපුර, අම්පාර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අම්පාර ඩිපෝව.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත


1A – G 040916 – 16 (2023/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගොතටුව නව නගරය, කජුගහවත්ත, පෙට්ට්‍රල් ෂෙඩ් ඉදිරිපිට පාර, අංක 16, නීතිඥ විජිතානන්ද මඩවලගම මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2019/263

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්. ජී. ඩී. මීවතුර මයා, ඩබ්. එම්. සුනිල් ජයරත්න මයා බාරේ, C/298/2, සේනානායකපුර, අම්පාර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අම්පාර ඩිපෝව.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''1998.05.02 දින මෙට්‍රෝ පොලිටන් බස් සමාගමේ කොන්දොස්තර ලෙස සේවයට බැඳී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයෙකු ලෙස සේවය කරන එම්. ජී. ඩී. මීවතුර මහතාට රැකියාව මෙතෙක් මෙතෙක් ස්ථිර නොකිරීම, වැටුප් වැඩි නොකිරීම, වැටුප් වර්ධක හා අතිකලා දීමනා හිමි නම් එය ලබා නොදීම මඟින් අසාධාරණයක් සිදුව තිබේ ද, යන්නත් එලෙස අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන මොනවාද යන්නත් පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 නොවැම්බර් මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 12 - 033

මගේ අංකය: IR/COM/02/2020/158

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2022.06.18 වැනි දින අංක 2284/65 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.06.02 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්. පී. කේ. රංජනී මිය, අංක 68, බටහිර කටුකෙන්ද, දංකොටුව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා ධීවර සංස්ථාව, මෝදර, කොළඹ 15.

අතර පවත්නා 2022.05.31 වැනි දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඩබ්. ඒ. බුද්ධික ප්‍රභාත් කරුණාතිලක මහතා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු ඩබ්. ඒ. බුද්ධික ප්‍රභාත් කරුණාතිලක මහතා එම ආරාවුලෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළ යුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2022.06.02 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 0034/1

මගේ අංකය: IR/COM/02/2020/158

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්. පී. කේ. රංජනී මිය, අංක 68, බටහිර කටුකෙන්ද, දංකොටුව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා ධීවර සංස්ථාව, මෝදර, කොළඹ 15.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, නක්කාවත්ත, බිහල්පොල, මුතුගල පාර, නීතිඥ රණසිංහ ආරච්චිගේ තිලකරත්න මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2020/158.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්. පී. කේ. රංජනී මිය, අංක 68, බටහිර කටුකෙන්ද, දංකොටුව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා ධීවර සංස්ථාව, මෝදර, කොළඹ 15.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ** වනුයේ,

"ලංකා ධීවර සංස්ථාවේ සේවය කළ ආර්. පී. කේ. රංජනී මහත්මිය වෙත MM I - I සේවා ශ්‍රේණියේ කළමනාකාර I ශ්‍රේණිය ලබා නොදීමෙන් ඇයට අසාධාරණයක් සිදු වී තිබේ ද? එසේ සිදු වී තිබේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ."

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 නොවැම්බර් මස 07 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 12 - 0034/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.